# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## කොළඹ , රත්නපුර හා කටුනායක අපනයන මධ්‍යස්ථාන මගින් අපනයන සේවා ලබාගන්නා සියළුම අපනයනකරුවන් වෙත කෙරෙන විශේෂ දැන්වීමයි

කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක ම/උ 27978/23 දරන නඩුවට අදාලව ගරු මහේස්ත්‍රාත්තුමන් විසින් 2025 මැයි මස 21 වන දිනැතිව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පහත නියෝගය නිකුත් කර ඇත.

| අනු අංකය | මැණික් ගල් වර්ගය | බර (කැරට්) | හැඩය |
|---|---|---|---|
| **01.** | යෙලෝ සෆායර් | 32.08 | ඕවල් |
| **02.** | රූබි | 4.09 | කුෂන් |
| **03.** | බ්ලූ සෆායර් | 3.66 | කුෂන් |
| **04.** | බ්ලූ සෆායර් | 5.04 | කුෂන් |
| **05.** | බ්ලූ සෆායර් | 2.60 | කුෂන් |
| **06.** | බ්ලූ සෆායර් | 5.25 | ඕවල් මික්ස් |
| **07.** | බ්ලූ සෆායර් | 7.06 | ඕවල් මික්ස් |
| **08.** | බ්ලූ සෆායර් | 4.23 | කුෂන් |
| **09.** | බ්ලූ සෆායර් | 4.06 | කුෂන් |
| **10.** | බ්ලූ සෆායර් | 4.10 | ඕවල් මික්ස් |

**"ඉහත ප්‍රමාණයේ මැණික් ගල් රැගෙන යාමට තැත්කළහොත් එය නවතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන අංක 01 හි ස්ථානාධිපති වෙත දැනුම් දෙන ලෙසට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ වගන්ති 124 ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ඔබට මෙයින් නියෝග කරමි."**

මේ අනුව 2025.07.18 වන දින සිට ඔබ විසින් අපනයනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අයිතම අතර ඉහත වගුවේ ඇතුළත් හෝ ඒ හා සමාන මැණික් ගල් අඩංගු වෙතොත්, ඒ බව මේ සමග ඇති ස්වයං ප්‍රකාශනය (Self Declaration) මගින් අධ්‍යක්ෂ (අපනයන සේවා හා අපනයන අලෙවි) වෙත ප්‍රකාශ කළ යුතුවේ.

ඔබ එසේ කිරීම පැහැර හැරීම, අපොහොසත්වීම ඉහත අධිකරණ නියෝගය නොසලකා හැර කටයුතු කිරීමක් ලෙස සලකා ගරු අධිකරණයට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංක 01වෙත වාර්තා කිරීමට සිදුවන බව ද දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය අතිශය අගය කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**
"මැක්සන්ස් ටවර්", අංක 12, ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩ්න්ස්,
කොළඹ 03.

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

**<u>ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අපනයන මධ්‍යස්ථාන මගින් අපනයන සේවා ලබාගන්නා අපනයනකරුවන් විසින් සිදුකරන ස්වයං ප්‍රකාශනය.</u>**

**1.** අපනයනකරුගේ නම/ සමාගමේ නම : ……………………………………………………………….

**2.** ජා. හැ. අංකය/ ව්‍යාපාර ලි. අංකය : ……………………………………………………………….

**3.** අධිකාරියේ වෙළඳ බලපත්‍ර අංකය : ……………………………………………………………….

**4.** අපනයනය කරනු ලබන දිනය : ……………………………………………………………….

**5.** ඉන්වොයිස් පත්‍රයේ අංකය : …………………………………CT අංකය.....………………….

| අනු අංකය | මැණික් ගල් වර්ගය | බර (කැරට්) | හැඩය | ඉහත අංක දරන ඉන්වොයිසිය / CT අංක දරන ඉන්වොයිස් පත්‍රයේ මෙම මැණික් ගල් | |
|---|---|---|---|---|---|
| | | | | අඩංගුවේ (✓) | අඩංගු නොවේ (✓) |
| 1. | යෙලෝ සෆායර් | 32.08 | ඕවල් | | |
| 2. | රූබි | 4.09 | කුෂන් | | |
| 3. | බ්ලූ සෆායර් | 3.66 | කුෂන් | | |
| 4. | බ්ලූ සෆායර් | 5.04 | කුෂන් | | |
| 5. | බ්ලූ සෆායර් | 2.60 | කුෂන් | | |
| 6. | බ්ලූ සෆායර් | 5.25 | ඕවල් මික්ස් | | |
| 7. | බ්ලූ සෆායර් | 7.06 | ඕවල් මික්ස් | | |
| 8. | බ්ලූ සෆායර් | 4.23 | කුෂන් | | |
| 9. | බ්ලූ සෆායර් | 4.06 | කුෂන් | | |
| 10. | බ්ලූ සෆායර් | 4.10 | ඕවල් මික්ස් | | |

කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ම/ළ 27978/23 දරන නඩුවට අදාලව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙත නිකුත් කර තිබෙන 2025 මැයි මස 21 වන දිනැති නියෝගය පිළිබඳව මම දැනුවත්ව සිටිමි.

මා විසින් අපනයනය සඳහා ඉදිරිපත් කරන අංක ................ හා ................ දිනැති ඉන්වොයිසියේ, එම අධිකරණ නියෝගයේ සඳහන් අයිතමයන් සහ/හෝ ඒ හා සමාන මැණික් ගල් ඇතුළත්ව ඇති / නැති බව ප්‍රකාශ කර සිටිමි.

ඉහත වගුවේ සඳහන් ගල් එකක් හෝ කිහිපයක් අපනයනය සඳහා ඉදිරිපත් වන අයිතමයන්හි ඇතුළත් වන්නේ නම් අපනයනකරු විසින් පහත තොරතුරු සැපයිය යුතුය.

1. එම මැණික් ගල්වල හිමිකරු කවුරුන් ද ? ..........................................................................................
2. ඔබ මිලට ගන්නේ නම් එහි හිමිකරු කවුරුන් ද? ..............................................................................
3. ඔබ මිලට ගත් දිනය ...............................................................................................................................
4. මෙම මැණික්වලට අදාළව ඔබට යමක් ප්‍රකාශ කිරීමට ඇත්තේ ද? ..................................................................
5. එසේ නම් ඒ කුමක් ද? ...............................................................................................................................

ඉහත තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත්, එම ගල්වලට අදාළ සියළු තොරතුරු මා විසින් මෙහි ප්‍රකාශ කර ඇති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

**අපනයනකරුගේ අත්සන හා මුද්‍රාව :** …………………………

දිනය : …………………………